# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,915—1948ක්වූ ඔක්තෝබර් මස 29 වෙනි දිනවූ සිකුරාදා.


## PART IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Kegalla No. 82.—සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වන 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ සිකුරාදා උදේ 10.30ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බොඩ කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම් කෑබලි 12ක්.

මුල් සිතියමේ අංක. A 24. ගම—දිවුල පල්ලේගම. අයිතිකාරයන්නා—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|
| 4 | ගල්කඹුල්ලේගල්දූන්නේමූකලාන | — | ගඟ්ඟහාපාරට වෙන්කර තිබෙන බිම්තීරය | 0 0 16 | —* |
| 5 | ගල්කඹුල්ලේහේන | — | අම්බලමට වෙන්කර තිබෙන බිම්කෑබැල්ල | 0 0 5 | —* |
| 7 | ගල්කඹුල්ලේගල්දූන්නේමූකලාන | — | කැලෑව | 1 0 24 | 66† |
| 9 | එම | — | එම | 0 1 4 | 21† |
| 10 | මැල්ලගලේහේන නොහොත් මැල්ලගලේවත්ත | — | මැණිකාගේ පුත් ආර්. පී. පංචිරාළහාමි අවසර නැතුව අල්ලාගත් වත්ත | 0 1 25 | 19‡ |
| 11 | එම | — | එම | 1 2 13 | 54‡ |
| 13 | දන්නහමඩිදෙනිය | — | ඌල්පතකට වෙන්කර තිබෙන දෙනිය | 0 0 24 | —* |
| 14 | මැල්ලගලේහේන | — | මැණිකාගේ පුත් ආර්. පී. පංචිරාළහාමි අවසර නැතුව අල්ලාගත් වත්ත | 0 0 25 | 16‡ |
| 15 | ගල්කඹුල්ලේගල්දූන්නේමූකලාන | — | මලඇලට වෙන්කර තිබෙන බිම්තීරය | 0 2 4 | —* |
| 16 | එම | — | කිරිබණ්ඩාගේ පුත් ආර්. පී. පංචිරාළහාමි අවසර නැතුව අල්ලාගත් වත්ත | 0 0 32 | 18‡ |
| 17 | මැල්ලගලේහේන නොහොත් මැල්ලගලේවත්ත | — | මැණිකාගේ පුත් ආර්. පී. පංචිරාළහාමි අවසර නැතුව අල්ලාගත් වත්ත | 1 0 3 | 31‡ |
| 18 | එම | — | ආර්. පී. පුංචිඅප්පුහාමි අවසර නැතුව අල්ලාගත් වත්ත | 0 0 39 | 13‡ |

* වෙන්කර තිබෙන බිම්තීර (වෙන්දේසි නොකරනු ලැබේ). † වෙන්දේසිකිරීමට.
‡ අංක. 383 දරණ ඉඩම් අනපනත යටතේ බේරුම්කරදීම පිණිසයි.

මේ ඉඩම ගැන වැඩිදුර විස්තර කෑගල්ලේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැක.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

Kegalla No. 83.—සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වන 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ සිකුරාදා උදේ 11.30ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ බෙලිගල් කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කෑබලි 1ක්.

මුල් සිතියමේ අංක. A. 335. ගම—කොබ්බෑමල. අයිතිකාරයන්නා.—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | තක්සේරු මිල, රු. ශ. |
|---|---|---|---|---|---|
| 1 | මන්තරකාරයලාගේ වත්ත | — | ඩබ්ලිව්. ආර්. සිංගිරිබන්ඩා, කේ. ඇම්. පංචිමැණිකා සහ එච්. රන්මැණිකා යන අයවලුන් අවසර නැතුව අල්ලාගෙන තිබෙන රබර්, පුවක් සහ පොල් වගාව ඇති බිම්කෑබැල්ල | 1 3 6 | 413·25* |

* අංක. 383 දරණ ඉඩම් අනපනත යටතේ බේරුම්කරදීම පිණිසයි.

මේ ඉඩම ගැන වැඩිදුර විස්තර කෑගල්ලේ උප ඒජන්තතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැක.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

No. 14,352, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වන 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට නාඋල ගම්බද උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ කොට්ඨාසයේ වගපනහ උඩසිය පත්තුවේ පිහිටා තිබෙන බිම්කෑබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ අංක. 256. ගම—නිකුල.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 260 | ඉහලහේන | මිල්ලවානගෙදර කිරලගේ කිරිබන්ඩා | හේන | 0 2 23 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවෙන මුදලක් වේ.

මෙහි ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

281——J. N. A 83469—119 (10/48)

No. 14,353, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට නාඋල ගම්බද උසාවියේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් නිරවුල්කරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ කෝරළයේ වගපනහ උඩසිය පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 254. ගම—නාඋල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 127 | ඇටඹිල්ලේයාය .. | සිගිරිය පදිංචි (1) වල්ලිවලගෙදර හිංගිරිබණ්ඩා, (2) එම ලොකු මැණිකා, (3) එම විකිරිබණ්ඩා, (4) එම කරුමැණිකා හා (5) එම පිංජිබණ්ඩා | හේන | .. 2 0 4 |
| 258 | මෙල්ලකොල්ල .. | නාඋල පදිංචි (1) අඹලිකාරගලප්පත්තියේ බබුනෝනා, (2) ගෙන්දවිකාරණියේ බෙබි නන්දුවති හා (3) එම ගුණවති | කැලය | .. 2 1 4 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100ට වැඩිනොවන මුදලක් වේ.

මෙහි ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

No. 14,354, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට මැදිපොල ගම්බද උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් නිරවුල්කරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ කෝරළයේ උඩුගොඩ පල්ලේසිය පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 98. ගම—වහකෝට්ටෙ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 106 | කලුකල .. | (1) දෙමටගොඩ පදිංචි චාලිස් පෙරේරා හා (2) උලපනේ කනක් බත්තේ සුපරින්ටැන්ඩන්ට්වූ එච්. බී. ඒ. පෙරේරා | පොල්වත්ත | .. 0 0 3 |
| 868 | කපුහේන .. | වහකෝට්ටෙ පදිංචි අස්කිරියෙගෙදර මෙනේරිහාමි .. | හේන | .. 0 3 33 |
| 869 | එම .. | වහකෝට්ටෙ පදිංචි කොහොඹගහගෙදර පේදුරු අප්පු .. | එම | .. 3 0 2 |
| 977 | ගොඩියතැන්නහේන | රොටම්බෙ පදිංචි (1) මුල්ලෑවෙගෙදර මරියහාමි, (2) එම අන්තෝනි (3) එම ජුවන් හා (4) එම බස්තියන් | එම | .. 0 2 5 |
| 1072 | අම්බට්ටකනකඹුලයාය හේන | (1) දම්ගොල්ලේ පදිංචි කපුගෙදර රංහාමි හා (2) ඇස්වෙද්දෙගෙදර උක්කුරාල | එම | .. 0 2 5 |
| 1182 | මෙරවගස්පිටියෙහේන | වහකෝට්ටෙ පදිංචි පිටියෙගෙදර මැණුවෙල් අප්පු .. | එම | .. 0 2 16 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙහි ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කළුතර දිස්ත්‍රික්කයේ වාද්දුවේ පොලිස් ස්ථානයට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ 203 වෙනි පරිච්ඡේදයේ" 5වෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගාර්තුවල ප්‍රකාරයට කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමතිතුමාගෙන් නියෝගකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 2,347. ගම—මිස්තාකිර මහා වාද්දුව (වාද්දුවේ සුළු නගර සභා සීමාව තුළ).

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | ගැටඹිගහවත්ත, වරිපනම් නො. 374, කාලු පාර | දෙහිවල කාලු පාරේ නො. 22A දරණ නිවසෙහි පදිංචි ජී. ඇෆ්. ප්‍රේරා හෝනාමහත්මී අයිතිකම්කියන අවුරුදු 60ක් වයස ඇති පොල්ගස් 149ක්ද, අවුරුදු 12ක් වයස ඇති පොල්ගස් 12ක්ද, අවුරුදු 60ක් වයස ඇති කොස්ගස් 4ක්ද, අවුරුදු 2ක් වයස ඇති කොස්ගස් 1ක්ද, අවුරුදු 30ක් වයස ඇති පුවක්ගස් 7ක්ද, අවුරුදු 40ක් වයස ඇති රම්බෙදල්ගස් 2ක්ද, අවුරුදු 30–40ක් වයස ඇති අඹගස් 6ක්ද, අවුරුදු 40ක් වයස ඇති කජුගස් 1ක්ද, අවුරුදු 30ක් වයස ඇති සියඹලාගස් 1ක්ද, අවුරුදු 5ක් වයස ඇති මල්බෙරිගස් 1ක්ද, අවුරුදු 15ක් වයස ඇති කොහොඹගස් 1ක්ද, අවුරුදු 5–10ක් වයස ඇති කෙත්තගස් 4ක්ද, අවුරුදු 15ක් වයස ඇති අරලියගස් 1ක්ද, අවුරුදු 10ක් වයස ඇති ඔලුගස් 3ක්ද, අවුරුදු 3ක් වයස ඇති දෙහිගස් 2ක්ද, අවුරුදු 2ක් වයස ඇති දොඩන්ගස් 2ක්ද, අවුරුදු 15ක් වයස ඇති බිලින්ගස් 1ක්ද, අවුරුදු 10ක් වයස ඇති පේරගස් 1ක්ද, අවුරුදු 20ක් වයස ඇති කාඹරන්ගාගස් 1ක්ද, උළු සෙවිලිකළ ගලෙන් බදිනලද ස්ථිර ගොඩනැගිලි 4ක්ද, ගලෙන් බදිනලද ළිඳක්ද, පොල්අතු සෙවිලිකළ තාවකාලික පැලක්ද ඇති වත්ත | 1 3 15·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ දෙසැම්බර් මස 8වෙනි දින පෙරවරු 9.30ට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඇස්. ඇම්. ඔෆ්ජ්,
දිසා ආණ්ඩුවේ උප ඒජන්ත වමින.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පූදලුඹයේ දෙමළ පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගාර්තුවල ප්‍රකාරයට, කෘෂිකර්මාන්තය පිළිබඳ ඇමතිතුමාගෙන් නියෝගකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,302. ගම—කඩදොරපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හැවැන්වැව .. | තදකාලික පාඨශාලා ගොඩනැගිල්ලක් ඇති වත්ත | පූදලුඹයේ පදිංචි කේ. සුප්පයියා සහ කේ. ආර්. රම්සාමි | 0 0 34·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ නොවැම්බර් මස 20වෙනි දින පෙරවරු 10.30ට කඩදොරපිටියේ දෙමළ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින
නුවරඑළියේ කච්චේරියේදීය.

ඇම්. රංජේනු,
ආණ්ඩුවේ උප ඒජන්ත වමින.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—Mt/රඹුක්කොළුව සිංහල මිශ්‍ර පාඨශාලාව සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශෝධනවල ප්‍රකාරයට ඉඩම් සහ ගොවිකම්කත්න පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,354. ගම—රඹුක්කොළුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කපුකොටුව .. | අවුරුදු 40ක් වයස ඇති ඇටඹගසක් සහ අවුරුදු 30ක මීගසක් ඇති ගෙත | ජේ. සී. ඇල්. රත්වත්ත, කවුඩෙනොට; මහනුවර | 1 1 14·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ නොවැම්බර් මස 29වෙනි දින පෙරවරු 10.30ට කාලයට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

එච්. ඇස්. අමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ත.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—Mt/කවුඩෙනියේ සිංහල මිශ්‍ර පාඨශාලා ගොඩනැගිල්ල විශාලකිරීම සහ ක්‍රීඩා භූමියක් ඇතිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශෝධනවල ප්‍රකාරයට ඉඩම් සහ ගොවිකම්කත්න පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,318. ගම—ලුඹුකොළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උනගොල්ලෙවත්ත | අවුරුදු 6 සිට 20 දක්වා වයසැති රබර්ගස් 42ක්ද, අවුරුදු 15ක් වයසැති ලුනුමිදෙල්ලගස් 15ක්ද, අවුරුදු 25ක් වයසැති පොල්ගස් 17ක්ද, අවුරුදු 20ක් වයසැති පුවක් ගස් 7ක්ද, අවුරුදු 40ක් වයසැති කොස්ගස් 21ක් සහ අවුරුදු 15ක් වයස ඇති කොකෝගස් 93ක්ද ඇති ඉඩම | මහසියාමේ පදිංචි එච්. ඇල්. රත්වත්තෙ සහ විල්වර් රත්වත්තෙ | 2 0 0 |
| | | | එකතුව .. | 2 0 0 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ නොවැම්බර් මස 29වෙනි දින පෙරවරු 11.30ට කාලයට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

එච්. ඇස්. අමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ත.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තංගල්ල සිත්තරු නිවාසය සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංශෝධනවල ප්‍රකාරයට ඉඩම් සහ ගොවිකම් පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. පී. පී. A 1,120. ගම—ඉදිපොකුනගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මැදගනවත්ත හෝහොත් මිදිගනවත්ත, නො. 479 ඒ කොටස, සත් සේරු කොටස, 3වෙනි කැබැල්ල | පොල්ගස් 4යි අවුරුදු 10යි, පොල්ගස් 40යි අවුරුදු 40යි, කල්ගස් 1යි අවුරුදු 40යි, අඹගස් 3යි අවුරුදු 25යි, දෙඹගස් 1යි අවුරුදු 10යි, දෙහිගස් 2යි අවුරුදු 10යි, දෙරුම්ගස් 8යි අවුරුදු 10යි, කොස්ගස් 1යි අවුරුදු 20යි, ඔදුමෙන් සෑදූ උළු සෙවිලිකළ ගෙවල් 2යි, කොන්ක්‍රීට්වලින් සාදපු වැසිකිලියක් | ජේ. ජී. වෙන්ගප්පුලි "ආදන් කොරෙජ්", තංගල්ල | 0 2 17·8 |

එබැවින් ඉඩම අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ නොවැම්බර් මස 24වෙනි දින උදේ 10.30ට තංගල්ලේ පරණ පොලිස් ස්ථානයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 22වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

ඩී. ජී. දයාරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ත.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—එච්/හම්බුස්සාවල පාසැල පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංශෝධනවල ප්‍රකාරයට ගොවිකම් සහ ඉඩම් පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අතුරු සිතියමේ නො. 2 සිට සිතියමේ නො. 298 ඇස්. පී. ගම—හම්බුස්සාවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 160 | රුක්අත්තනගහදෙනියෙ මහවත්ත හෝහොත් පලුවත්ත | පොල්ගස් 3යි වයස 25යි, පොල්ගස් 34යි වයස 3යි, පුවක්ගස් 10යි වයස 3-6යි, කොස්ගස් 1යි වයස 50යි, වරිච්චිවලින් සාදනලද පාසැලක් සහ වැසිකිලියක් | දෙන් දිනෝහිස් රම්නායක, වෙල් ඉලාදූනියා, හම්බුස්සාවල | 0 2 16·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1948ක්වූ නොවැම්බර් මස 24වෙනි දින පස්වරු 3ට බෙලිඅත්ත පොලිසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේත් අයිතිකමේ තොරතුරුකියා සිටින්ට ඕනෑ බවමෙයින් දැනගත යුතුයි.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

ඩී. ජී. දයාරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ත.

## ඉඩම් නිදහස්කිරීම පිළිබඳවූ 1942කේ අංක 61 දරණ ආඥාපණත යටතේ ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීමයි.

**මේ 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණත සම්බන්ධයෙන් ඉඩම් අත්කරගැනීමේ දැන්වීමයි.**

1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණතේ 2 (3)වෙනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්තුමා විසින් මට දී තිබෙන බලයම්ව ක්‍රියාකරන උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතැනවූ, පිලිප් ජේම්ස් හබිසන් වන මම, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 6වෙනි වගන්තිය යටතේ මේ ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශකරමි, එනම්:—

(1) 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණත සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්තුමා විසින් මීට යාකොට ඇති උප ලේඛනයෙහි විස්තරකරනලද ඉඩම අත්කරගත යුතුයයි තීරණයකරගෙන තිබෙන බව හා ආණ්ඩුව එකී ඉඩම අත්කර ගැනීමට අදහස්කරන බවත්;

(2) ඒ ඉඩමට ඇති සියළුම අයිතිවාසිකම් වෙනුවෙන් වන්දි ඉල්ලිය යුත්තේ මගෙන් බවත්;

(3) ඒ ඉඩම කෙරෙහි අයිතිවාසිකම් දක්වන හැමදෙනාම තම තමන් විසින්ම හෝ නියෝජිතයෙකු මගින් යාපනේ කච්චේරියේදී මේ 1948ක්වූ නොවැම්බර් මස 26වෙනි දින පූ. භා. 10ට යාපනේ කච්චේරියේදී මා ඉදිරියේ පෙනීසිට ඒ ඉඩම කෙරෙහි තම තමන්ගේ ඇති අයිතිවාසිකම්වල ස්වභාවයත් ඒ අයිතිවාසිකම්වලට වන්දි සඳහා කරන ඉල්ලීම්වල මුදල හා තොරතුරුත් කියාසිටිය යුතු බවත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

පී. ජේ. හබිසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

මුල් පිඹුරේ අංකය A 1,540. ගම.—සරසාලයි.

| කට්ටිය. | ඉඩමේ නම. | විස්තර. | ඉල්ලුම්කරුගේ නම. | බිම් ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුරුකන්වච්චි තොනොත් තිල්ලන්කුලි | වී කුඹුර .. | වාවකච්චේරි සරසාලයි පදිංචි ඇස්. තියාගරාජම්ගහ, (කිට්ටු පෝස්ට්මාස්ටර්) | 1 3 2 |

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO